# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 159/6 — 1975 අප්‍රේල් 17 වැනි බ්‍රහස්පතින්ද — 1975.04.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

කොදි/මිපා/4 දරණ මිල නියෝගය | කිරිහු පිටි

**මිල පාලන පනත**

**නියෝග**

කොළඹ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක හැන්පත් ධන්කන් විල්ප්‍රඩ් ද අල්විස් වන මම (173 වන අධිකාරය), මිල පාලන පනතේ 4 වන වගන්තියෙන් හා 3 (2) යන වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) 1975 මාර්තු මස 17 වැනි දින අංක 155/2 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1975 ජනවාරි මස 01 වැනි දින සහ අංක : කොදි මිපා/දරණ මිළ නියෝගය 1975.3.31 දින සිට බලපැවැත්වීම මෙයින් අවලංගු කරමි.

(2) තවද මීට යාකර ඇති උපලේඛනයෙහි 2 සහ 3 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් පාරිභෝගිකයින්ට නිකුත් කරන තිරිහු පිටි තොග වශයෙන් හා සිල්ලරට විකිණීමේදී ශුද්ධ බර රා. 112ක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත 1975.3.31 වැනි දින පටන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තිරිහු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට ශුද්ධ බර රාත්තල් 112ක් හෝ ඊට වැඩි ඕනෑම ප්‍රමාණයක් විකිණීමක් තොග වශයෙන් විකිණීම ලෙස සලකන බවත්,

(ආ) තිරිහු පිටි ඕනෑම් ප්‍රමාණයක් පාරිභෝගය හෝ පාවිච්චිය සඳහා හෝ ශුද්ධ බර රාත්තල් 112ට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) 'තිරිහු පිටි ' යන්නට ඉරිඟු පිටි, තිරිහු පිටි කලවම් කරන ලද මිශ්‍රණයක් ඇතුළත් වන බවත්,

(ඈ) ශුද්ධ බර රාත්තල් 112කට අඩුවෙන් හෝ වැඩියෙන් හෝ තොග වශයෙන් විකුණන යම් ඉරිඟු පිටි ප්‍රමාණයකට අයකළ යුතු උපරිම මිළ, සාමාන්‍ය වශයෙන්, මෙම උපලේඛනයේ ශුද්ධ බර රාත්තල් 112කට තොග වශයෙන් විකිණීමට නියම කරන ලද උපරිම මිළේ අනුපාතය අනුව විය යුතු බවත් නියම කරමි.

(4) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන, සෑම ප්‍රදේශයක් ඇතුළත කිසිවකු විසින් තිරිහු පිටි, බඩ ඉරිඟු පිටි හැර වෙනත් කිසිම ද්‍රව්‍යයක් මිශ්‍රකර නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(5) බරෙන් සියයට දහයකට වැඩි ප්‍රමාණයක් බඩ ඉරිඟු පිටි අඩංගු බඩ ඉරිඟු පිටි හා තිරිහු පිටි මිශ්‍රණයක් කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තිරිහු පිටි සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම තිරිහු පිටි ප්‍රමාණයක් සුදුසු භාජනයක තබා එම ආහාර ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එම තිරිහු පිටි සහ එම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) තවද, එම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් තිරිහු පිටි විකුණන සෑම කැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ තිරිහු පිටි වල ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ තිරිහු පිට සඳහා ගෙවූ මුදල, සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන විග ඇතුළත් කුවිතාන්සියක් මිළ දී ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා ' රාත්තල ' නොහොත් ' රා. ' යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) තවද, තිරිහු පිටි විකිණීමේ දී එම තිරිහු පිටි යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහා ලනු ලැබේ නම් එහි මිළත් එම නියෝගයෙන් නියම කරනු ලැබූ වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1975 මාර්තු මස 31 වැනි දින කොළඹ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ධන්කන් විල්ප්‍රඩ් ද අල්විස්,
කොළඹ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක,

1 A——ඒ, 19594—4,425 (75/04)

## උපලේඛනය

### තිරිඟු පිටි

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>ශුද්ධ බර රා. 112 හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| (1) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) මීරිගම | 122 66 | |
| (ආ) පල්ලෙවෙල | 122 66 | 1 11 |
| (ඇ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 66 | |
| (2) මීගමුව ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) මීගමුව | 122 50 | |
| (ආ) සීදුව | 122 50 | |
| (ඇ) කටාන | 122 54 | 1 11 |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 52 | |
| (3) මිනුවන්ගොඩ උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) මිනුවන්ගොඩ | 122 49 | |
| (ආ) මාබෝදලේ | 122 49 | |
| (ඇ) උඩුගම්පොල | 122 49 | 1 11 |
| (ඈ) කෙහෙල්ඇල්ල | 122 54 | |
| (ඉ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 49 | |
| (4) දිවුලපිටිය උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) දිවුලපිටිය | 122 54 | |
| (ආ) කොටදෙණියාව | 122 66 | 1 11 |
| (ඇ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 66 | |
| (5) අත්තනගල්ල උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) වෙයන්ගොඩ-බෙම්මුල්ල | 122 50 | |
| (ආ) නිට්ටඹුව | 122 50 | |
| (ඇ) ඌරාපොල | 122 58 | 1 11 |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 66 | |
| (6) ගම්පහ උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) ගලහිටියාව | 122 08 | |
| (ආ) හෙනරත්ගොඩ | 122 50 | |
| (ඇ) ගම්පහ | 122 50 | 1 11 |
| (ඈ) යක්කල | 122 50 | |
| (ඉ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 52 | |
| (7) වැකේ උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) දෙම්පේ | 122 80 | |
| (ආ) කැරගල | 122 80 | |
| (ඇ) පූගොඩ | 122 78 | 1 11 |
| (ඈ) කිරිදිවැල | 122 64 | |
| (ඉ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 66 | |
| (8) කැළණිය/කඩවත ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) දළුගම | 122 10 | |
| (ආ) කැළණිය | 122 16 | |
| (ඇ) බියගම | 122 16 | 1 11 |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 31 | |
| (9) කොලොන්නාව උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) කොලොන්නාව | 121 89 | |
| (ආ) කොටිකාවත්ත | 121 89 | 1 11 |
| (ඇ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 121 89 | |
| (10) නුගේගොඩ උප දිසාපති කොට්ඨාශය— | | |
| (අ) කෝට්ටේ | 121 81 | |
| (ආ) මහරගම | 121 83 | |
| (ඇ) දෙහිවල-ගල්කිස්ස | 121 81 | 1 11 |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 121 83 | |
| (11) හංවැල්ල ප්‍රා.ආ. නි. කොට්ඨාශය— | | |
| (අ) පහත්ගම | 122 45 | |
| (ආ) හංවැල්ල | 122 45 | |
| (ඇ) අවිස්සාවේල්ල | 122 65 | |
| (ඈ) පාදුක්ක | 122 45 | 1 11 |
| (ඉ) වග | 122 53 | |
| (ඊ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 57 | |

| 1 වැනි තීරය<br>ප්‍රදේශ | 2 වැනි තීරය<br>ශුද්ධ බර රු. 112 හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|
| (12) හෝමාගම ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) කඩුවෙල | 122 44 | |
| (ආ) බත්තරමුල්ල | 122 10 | 1 11 |
| (ඇ) හෝමාගම | 122 32 | |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 40 | |
| (13) වත්තල ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) වැලිසර–රාගම | 122 03 | |
| (ආ) හැඳල | 122 08 | |
| (ඇ) බෝපිටිය | 122 25 | 1 11 |
| (ඈ) වත්තල | 122 03 | |
| (ඉ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 17 | |
| (14) ජා–ඇල ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) දඬුගම්පේරුව | 122 26 | |
| (ආ) කඳාන–ජාඇල | 122 03 | 1 11 |
| (ඇ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 17 | |
| (15) පිළියන්දල ප්‍රා. ආ. නි. කොට්ඨාශය— | | |
| (අ) මොරටුව | 121 87 | |
| (ආ) පිළියන්දල | 121 87 | |
| (ඇ) පොල්ගස්ඕවිට | 121 93 | 1 11 |
| (ඈ) බෝකුන්දර | 121 87 | |
| (ඉ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 121 90 | |
| (16) මහර ප්‍රා.ආ.නි. කොට්ඨාශය— | | |
| (අ) මහර | 122 10 | |
| (ආ) නාරන්වල | 122 55 | 1 11 |
| (ඇ) ඌරුවල්පේරුව | 122 55 | |
| (ඈ) ඉහත සඳහන් නොවූ වෙනත් ස්ථාන | 122 55 | |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් එම ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

4–514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී